# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු සඳහා වන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන සහ සාමාන්‍ය පරිපාලන, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07 යන ලිපිනයට හෝ **recruitment@pgim.cmb.ac.lk** වෙත 2025.01.20 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. කරුණාකර අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ හෝ ඊමේල් පණිවිඩයේ විෂය තීරයේ අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

අදාළ අයදුම්පත් ආකෘතිය හා වැඩිදුර විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය වන **https://pgim.cmb.ac.lk** වෙතින් ලබාගත හැක. අදාළ නිර්දිෂ්ඨ අයදුම්පත් ආකෘති මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ අවශ්‍ය විස්තර සම්පූර්ණ නොමැති මෙන්ම සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සනාථ කිරීමට අවශ්‍ය සහතිකපත්‍රවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

## 01. තාක්ෂණ නිලධාරී II ශ්‍රේණිය Seg. "A" (විද්‍යාගාර) - තනතුරු 02

**සුදුසුකම් :-**

(I) වෛද්‍ය විද්‍යාගාර පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

**හෝ**

(II) වෛද්‍ය විද්‍යාගාර පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

**හෝ**

(III) පිළිගත් ආයතනයකින් ලබාගත් අවම වශයෙන් වසර දෙකක (02) පූර්ණ කාලීන වෛද්‍ය විද්‍යාගාර පිළිබඳ ඩිප්ලෝමාවක් සමග වෛද්‍ය විද්‍යාගාර ක්ෂේත්‍රයෙහි වසර එකක (01) පළපුරුද්ද.

**සටහන**

- පහත සඳහන් සුදුසුකම් සහ/ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය හිමි වේ.
  - ➢ පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය විද්‍යාගාර විද්‍යාව (MLS) පිළිබඳ උපාධිය සමග පිළිගත් ආයතනයක වසර එකක පළපුරුද්ද
  - ➢ SLMC ලියාපදිංචිය සමග වෛද්‍ය විද්‍යාගාර විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව සහ ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ වසර 2ක පළපුරුද්ද/ වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ Msc උපාධිය
  - ➢ වෛද්‍ය/ සායනික ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ Bsc උපාධිය සමග පිළිගත් ආයතනයක ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ වසර 2ක පළපුරුද්ද.

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

තෝරාගැනීම : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වැටුප් පරිමාණය : රු. 35,145-7X355; 9X495-42,085, 2020.01.01 දිනට මාසික වැටුප (U MT 1 (II))

## 02. තාක්ෂණ නිලධාරී තනතුර (යාන්ත්‍රික) (III ශ්‍රේණිය)- තනතුරු 01

**සුදුසුකම් :**

(I) අ.පො.ස (උ/පෙ) විභාගය භෞතික විද්‍යා විෂය ධාරාවෙන් එකවර විෂයන් තුනක් (3) සමත් වී තිබීම

**සහ**

(II) තෘතීයක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ යාන්ත්‍රික ඉංජිනේරු/ හෝ සමාන ක්ෂේත්‍රයේ ආයතනයක් විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද N.V.Q මට්ටම 5ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

තෝරාගැනීම : ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වැටුප් පරිමාණය : රු. 31,625-7X300; 10X355-37,275, 2020.01.01 දිනට මාසික වැටුප (U MT 1 (III))

## 03. තාක්ෂණ නිලධාරී තනතුර (ICT) III ශ්‍රේණිය - තනතුරු 01

**සුදුසුකම් :**

(I) අ.පො.ස (උ/පෙ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එකවර විෂයන් තුනක් (03) සමත් වී තිබීම

**සහ**

(II) තෘතීයක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ තොරතුරු සංනිවේදන සහ බහුමාධ්‍ය තාක්ෂණ/ තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ හෝ සමාන ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක් විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද N.V.Q මට්ටම 5ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

* ICT ක්ෂේත්‍රයේ වැඩ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

තෝරාගැනීම : ලිඛිත සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි

වැටුප් පරිමාණය : රු. 31,625- 7X300; 10X355-37,275, 2020.01.01 දිනට මාසික වැටුප (U MT 1 (III))

## 04. කළමනාකාර සහකාර තනතුර III ශ්‍රේණිය (ගබඩා පාලන) - තනතුරු 01

**සුදුසුකම් :**

(I) අ.පො.ස (සා/පෙ) විභාගය පහත විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයක් (06) සමත් වී තිබීම

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව

ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය

iii. ගණිතය

**සහ**

(II) අ.පො.ස (උ/ පෙ) විභාගය සියලුම විෂයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

පහත සුදුසුකම් හිමි අයදුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය හිමිවේ.

අ) පිළිගත් ආයතනයක් මගින් ලබාගත් මාස හයක (06) කාලයකට නොඅඩු පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත් සුදුසුකමක්

**සහ**

ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද

**තනතුරට විශේෂිත සුදුසුකම් :**

- ගබඩා පාලනය පිළිබඳ වසර එකක පළපුරුද්ද සහ/ හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂය සමත් වී තිබීම හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂය සමත් වී තිබීම.

**සටහන :**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය විසින් තීරණයකරණ පරිදි ආරක්ෂක තැන්පතුවක්/ මුදල් සුරැකුමක් ඉදිරිපත් කළ යුතුය.

වයස : අයදුම්පත් අවසන් කරණ දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

තෝරාගැනීම : ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි

වැටුප් පරිමාණය : රු.30,725-17X300-35,825, 2020.01.01 දිනට මාසික වැටුප (U MN 1 (III))

සැ.යු - ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

යහපත් චරිතයකින් හෙබි අයකු විය යුතුයි.

## 05. වැඩ අධීක්ෂක (නඩත්තු) III ශ්‍රේණිය - තනතුරු 01

**සුදුසුකම් :**

(I) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය, දෙවරකට (02) නොවැඩි අවස්ථාවකදී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් සමත් වී තිබීම.

(II) කම්කරු අධීක්ෂණය පිළිබඳ අවම වශයෙන් වසර 3ක පළපුරුද්ද

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

තෝරාගැනීම : ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වැටුප් පරිමාණය : රු. 30,725- 17X300-35,825, 2020.01.01 දිනට මාසික වැටුප (U MN 1 (III))

**අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2025.01.02**